# මුස්ලිම් හා කතෝලික සංස්කෘති ව්‍යාප්තිය

අප කලින් ද සඳහන්කර ඇති පරිදි මෙරට මුස්ලිම් ජනයා තමන්ට ලංකාව මුස්ලිම් කළ හැකිව තිබිණි යැයි සඳහන් කර නැත. ඒ බවක් කියන්නේ තමන්ට ගෞරවයක් ලබාගැනීමට අදහස් කරන බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අයත් පිරිසකි. මේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අයත් පිරිස කියන්නේ පෘතුගීසීන් නොපැමිණෙන්නට ලංකාව මුස්ලිම් වීමට තිබුණු බවත් පෘතුගීසීන් ලංකාව ඉන් ගලවාගත් බවත් ය. ඒ කියමන හුදු හිතළුවක් පමණක් බව අපි දුටුවෙමු. එසේ ම එහි ඇත්තේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට තමන්ට අනිසි ගෞරවයක් ලබාගැනීමේ චේතනාව හා තමන් කරන්නට ගිය කාර්යයක් වසංකිරීමේ අවශ්‍යතාව ය. බටහිරයන්ට එදා අවශ්‍ය වූයේත් අද අවශ්‍ය වන්නේත් මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය නැතිකර බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අප මත බලෙන් පැටවීම ය.

බටහිරට අද අවශ්‍ය කරන්නේ එදා තමන්ට තිබූ අවශ්‍යතාව වසංකිරීමට ය. එහෙත් ඒ කළ හැක්කක් නො වෙයි. එදා මෙන් ම අද ද බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රධාන අරමුණක් වී ඇත්තේ මුළු ලෝකය පුරාම යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය පැතිරවීම ය. මෙයින් අදහස් කරන්නේ මුස්ලිමුන්ට එවැනි අවශ්‍යතාවක් නොතිබූ බව නො වෙයි. ලංකාවේ එදා මුස්ලිම් ආධිපත්‍යයක් පිහිටුවීමේ හැකිකමක් නොතිබුණ ද, මුස්ලිමුන්ට ද ලෝකය පුරා තම සංස්කෘතිය ප්‍රචලිත කිරීමේ අවශ්‍යතාව වෙයි. අද ලෝකයේ ක්‍රිස්තියානි මුස්ලිම් ගැටුමේ මුල ඇත්තේ මේ අවශ්‍යතා අතර ප්‍රතිවිරුද්ධතාව ය. එහි දී වඩාත් දක්‍ෂතා දක්වා ඇත්තේ යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය ය.

අප සාකච්ඡා කරමින් සිටින්නේ සංස්කෘතියක් තවත් සංස්කෘතියක් හමුවූ කල ඇතිවන ප්‍රතිඵල ය. වෛදික හා හින්දු සංස්කෘතිය ඇතිවීමත් දඹදිව භාරතය බවට පත්වීමත් ආර්‍ය සංස්කෘතිය හා අනාර්‍ය (ද්‍රවිඩ නොවන) සංස්කෘතිය මිශ්‍රවීමේ ප්‍රතිඵලයක් විය. දඹදිවට පැමිණි ආර්‍යයන්ට තම සංස්කෘතිය එහි පැතිරවීමේ අවශ්‍යතාව තිබුණ ද, ඒ මුළුමනින් ම කරගැනීමට නො හැකි විය. දඹදිව පැවති අනාර්‍ය සංස්කෘතියේ අංග රාශියක් භාරතීය සංස්කෘතියට එක් වී ඇත. යුද්ධ ශක්තිය, එනම් දේශපාලන ශක්තිය අතින් ගත්කල ආර්‍ය සංස්කෘතිය බලවත් වූ නමුත් සංස්කෘතියක් ලෙස ගත්කල දඹදිව අනාර්‍ය සංස්කෘතියෙහි ශක්තිමත් අංගෝපාංග විය.

ඒ ඒ සංස්කෘතිය තම සංස්කෘතිය ව්‍යාප්ත කිරීමේ දී අනුගමනය කරන ක්‍රමවේද වෙනස් වෙයි. ඇතැම් සංස්කෘතීන් ව්‍යාප්තවන්නේ රාජ්‍ය හෝ වෙනත් අනුග්‍රහයක් නො මැතිව ය. ලංකාවේ ථෙරවාද බෞද්ධ සංස්කෘතිය පැතිරයෑම ඒ සඳහා උදාහරණයකි. ථෙරවාද බුදුදහම ලංකාවේ හා අග්නිදිග ආසියාවේ ව්‍යාප්ත වූයේ ඒ රටවල පැරණි සංස්කෘතීන් හා ථෙරවාද බෞද්ධ සංස්ලෘතිය අතර එකඟතාවක් තිබූ බැවිනි. බුදු දහම ඒ රටවලට හඳුන්වා දීම මාළුවා දියට දැමීමක් විය.

යුදෙව් සංස්කෘතිය අනෙක් සංස්කෘතීන්ට අයත් ජාතීන් අතර පතුරවන්නේ අමුතුම ආකාරයකට ය. එසේ පැතිරවීමේ දී යුදෙව්වෝ අනෙක් වාර්ගිකයන් යුදෙව්වන් බවට  පත්කිරීමට උත්සාහ නො ගනිති. යුදෙව්වකු විය හැක්කේ උත්පත්තියෙන් බවට විශ්වාසයක් පවතී. ඒ අවශ්‍යතාව බිඳ දමා ඇති අවස්ථා ද නැතිවා නො වේ. එහෙත් යුදෙව් බව වෙනත් අයට බලයෙන් පැටවීමට යුදෙව්වෝ උත්සාහ ගනිති. යුදෙව්වකු නොවී වුව ද යුදෙව් සංස්කෘතිය පිළිගැනීමේ හෝ පිළිගැන්වීමේ හෝ බාධාවක් නො මැත.

මෙහි දී එක් උදාහරණයක් පමණක් දිය හැකි ය. යුදෙව්වෝ තම දෙවියන් වහන්සේ වූ යොහෝවා දෙවියන්ගේ පිළිම නො සාදති. ඒ පිළිම සෑදීම යුදෙව් සංස්කෘතියෙහි තහනම් වෙයි. එයට හේතුවක් ද වෙයි. යෙහෝවා දෙවියන් යනු වියුක්ත දෙව් කෙනෙකි. උන්වහන්සේ රූපයක් සිතෙන් මවාගත නො හැකි ය. එබැවින් යෙහෝවා දෙවියන්ගේ පිළිරුවක් ඇඹීම නො කළ හැකි ය. යුදෙව්වෝ තම සංස්කෘතියෙහි ඇති මේ අංගය අනෙක් සංස්කෘතීන් මත ද බලයෙන් පැටවීමට උත්සාහ දැරූහ. ඔවුහු අනෙක් සංස්කෘතීන්වල දෙවියන්ගේ ප්‍රතිමා කඩා  බිඳ දැමූහ. එමගින් ඔවුන් බලකර සිටියේ අනෙක් සංස්කෘතීන්ට ද තම සංස්කෘතිය වැළඳ ගන්නා ලෙස ය. තම සංස්කෘතිය වැළඳ ගැනීමට බල කෙරුණ ද අන්‍යයුන්ට යුදෙව්වන් වීමට බල නො කෙරිණි.

© Prof. Nalin De Silva

එහෙත් මුස්ලිම් සංස්කෘතියෙහි එයට වඩා වෙනසක් වෙයි. මුස්ලිම්වරු අන්‍යයන්ට තම සංස්කෘතිය පටවන්නේ ඔවුන් ද මුස්ලිම් කරමිනි. ඉස්ලාම් ආගම වැලඳ නොගෙන මුස්ලිම්වීමට නො හැකි ය. එමෙන් ම මුස්ලිම්වරු තම සංස්කෘතිය හා ඒ සමග ආගම පැතිරවීම සඳහා යුද්ධකිරීමට වුව ද පෙළඹෙති. යුදෙව්වෝ තම සංස්කෘතිය (ආගම නොමැතිව) ව්‍යාප්ත කිරීම සඳහා යුද්ධ කළහ. මුස්ලිම් සංස්කෘතියෙහි හා ඉස්ලාම් ආගමෙහි ව්‍යාප්තිය සඳහා යුද්ධ රාශියක් කෙරී ඇති බවට ඉතිහාසය සාක්ෂි දරයි. යුදෙව් සංස්කෘතිය හා මුස්ලිම් සංස්කෘතිය එකම මූලාශ්‍රවලින් පැන නැගුණ ද ඔවුන්ගේ දෙවියන් වහන්සේ කිනම් අර්ථයකින් ගත්ත ද එකම තැනැත්තා වුව ද ඒ සංස්කෘතීන් අතර ප්‍රධාන වෙනස්කම් ද වෙයි. ඉස්ලාම් ආගමේ අල්ලා දෙවියන් වහන්සේ හා යුදෙව්වන්ගේ යෙහෝවා දෙවියන් වහන්සේ යනු අවසාන විග්‍රහයෙහි දී එක් අයෙක් ම වෙති. අල්ලා දෙවියන් වහන්සේ ද වියුක්ත දෙව් කෙනෙකි. එතුමන්ගේ ද පිළිම ඇඹිය නො හැකි ය. සංස්කෘතීන් දෙකෙහි ම පරණ තෙස්තමේන්තුව පිළිගැනෙයි. ලෝකය මැවීමෙහිලා වියුක්ත දෙවියන් වහන්සේ විසින් කරන ලද කාර්යය පිළිගැනෙයි. එහෙත් දෙවියන් වහන්සේ සම්බන්ධයෙන් ඇති මේ වියුක්තබව මුස්ලිම් සංස්කෘතියෙහි හෝ කතෝලික සංස්කෘතියෙහි හෝ දක්නට නැත.

එයට ප්‍රධාන හේතුවක් වන්නට ඇත්තේ ලෝකය මැවීම පිළිගැනීම කෙසේ වෙතත් ලෝකයේ ජීවත්වීම වියුක්තව ගැනීමට බොහෝ දෙනකුට නොහැකිවීම යැයි සිතිය හැකි ය. යුදෙව් සංස්කෘතියෙහි කලින් කල පහළවන අනාගත වක්තෘන්ට (Prophets) එතරම් වැදගත් තැනක් හිමි නො වෙයි. එහෙත් කතෝලික ආගමත් ඉස්ලාම් ආගමත් ඒ තත්වය මුළුමනින් ම වෙනස් කෙළේ ය. අවශ්‍ය නම් ක්‍රිස්තුස් වහන්සේ යුදෙව් සංස්කෘතියෙහි තවත් අනාගත වක්තෘන් කෙනකු ලෙස සැලකිය හැකිව තිබුණි. එහෙත් කතෝලික ආගමෙහි උන්වහන්සේ දෙවියන් වහන්සේ ම බවට පත්කෙරිණි. එමගින් කතෝලිකයෝ දෙවියන් වහන්සේගේ ද වියුක්ත බව නැතිකළහ. දෙවියන් වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ ලෙස මවු කුසකින් උපත ලද්දේ නම් ඒ බිළිඳා හා පසුව වැඩිහිටියා අනෙක් සියල්ලන්ට පෙනෙන ලෙස ජීවත් වී නම් උන්වහන්සේ තවදුරටත් වියුක්ත නොවූහ. කතෝලිකයන්ට ක්‍රිස්තුස් වහන්සේගේ හා මරියතුමියගේ පිළිම (සුරුවම්) ඇඹීමේ බාධාවක් නැත.

ඉස්ලාම් ආගම දෙවියන් වහන්සේ සංයුක්ත කිරීමෙහි ලා කතෝලික ආගම ගිය දුර ගොස් නැත. ඉස්ලාම් ආගමෙහි මහමත්තුමා අනාගත වක්තෘන් තත්වයෙන් දෙවියන් වහන්සේගේ තත්වයට ගොස් නැත. එහෙත් මහමත්තුමා යුදෙව් සංස්කෘතියෙහි හා යුදෙව් ආගමෙහි දක්නට ලැබෙන තවත් අනාගත වක්තෘන් කෙනෙක් නො වෙයි. එතුමා ගැන ද සඳහන් වන්නේ අනාගත වක්තෘන් කෙනකු ලෙස වුව ද එතුමා ශාස්තෘවරයෙක් ද වෙයි. එක්තරා ආකාරයකට ගතහොත් මහමත්තුමා යුදෙව් සංස්කෘතියෙහි අනාගතවක්තෘන් කෙනකු හා දෙවියන් වහන්සේ සම්බන්ධයෙන් ගත්කල අතරමැදි තැනක් උසුලයි. ඉස්ලාම් ආගමට හා මුස්ලිම් සංස්කෘතියට අනුව ක්‍රිස්තුස්වහන්සේ ද තවත් අනාගත වක්තෘන් කෙනෙක් වෙති.

ඒ කෙසේ වෙතත් මහමත්තුමා ඔස්සේ ඉස්ලාම් භක්තිකයනට සංයුක්ත, ඉන්ද්‍රිය ගෝචර ශාස්තෘන්වන්සේ කෙනකු ලැබී ඇත. කතෝලිකයන් ක්‍රිස්තුස් වහන්සේ ඔස්සේ ද මුස්ලිමුන් මහමත්තුමා ඔස්සේ ද යුදෙව් සංස්කෘතිය සංයුක්ත කර ඇත. එමෙන් ම කතෝලිකයෝ ද ඉස්ලාම් භක්තිකයෝ ද තම සංස්කෘතිය පැතිරවීමට යුද්ධකිරීමට වුව ද සූදානම් අතර ඒ ඒ ආගම වැළඳ ගැනීමෙන් තොරව අදාළ සංස්කෘතියට වැද්දගැනීම ප්‍රතික්ෂේප කරති. ඉස්ලාම් ආගම වැළඳ ගැනීමකින් තොරව මුස්ලිම් සංස්කෘතියට ඇතුල්වීය නොහැකි ය. කතෝලික ආගමිකයකු නොවී කතෝලික සංස්කෘතියට වැද්ද ගැනීමක් නොවුණ ද යමකුට අවශ්‍ය නම් කතෝලික සංස්කෘතියට අයත්වීමට හැකි විය. දෙගොල්ලෝම අනෙක් අයට තම සංස්කෘතිය බලයෙන් පැටවීමේ දී ඔවුන් මත තම ආගම ද පැටවූහ. මෙය යුදෙව් සංස්කෘතියෙන් පැහැදිලි ලෙස ම කැපී වෙන්වන කරුණකි.

මෙයට හේතුව වියුක්ත සංස්කෘතියක් වූ යුදෙව් සංස්කෘතියෙහි එක්තරා දුරකට වෙන්කිරීමේ හැකියාව ද වීම ය. වෙනත් අයකුට ආගමින් යුදෙව්වකු නොවී යුදෙව් සංස්කෘතිය ලබාදීම යුදෙව්වනට ප්‍රශ්නයක් නො වී ය. එහෙත් කතෝලිකයනට හා මුස්ලිමුන්ට වෙනත් අයකු තම තමන්ගේ ආගම් නොපිළිගෙන සංස්කෘතිය පමණක් පිළිගැනීම ප්‍රශ්නයක් විය. කතෝලික හා මුස්ලිම් සංස්කෘතීන් වියුක්ත නොවීමේ එක් ප්‍රතිඵලයක් වූයේ ඒ සංස්කෘතීන්වල බටහිර විද්‍යාව ධනපති ක්‍රමය ආදිය පැන නොනැගීම ය. ඒ සංස්කෘතී දෙකම සංයුක්ත සංස්කෘති වූවා පමණක් නොව වෙන්කිරීමට හා පෞද්ගලිකත්වයට අනුබල නොදෙන සාමූහිකත්වය අගය කරන සංස්කෘති ද විය. බොහෝ දුරට

© Prof. Nalin De Silva

සමානකම් තිබූ මේ සංස්කෘති දෙක ලෝක ආධිපත්‍යය සඳහා එක් කලෙක සටන් වැදුණි. දැනුදු ඒ සටන වෙනත් ස්වරූපයකින් මුස්ලිම් - යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතික ගැටුමක් ලෙස ක්‍රියාත්මක වෙයි.

යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය යනු බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ප්‍රතිඵලයකි. කතෝලික සංස්කෘතිය හා මුස්ලිම් සංස්කෘතිය බිහිවීමේ දී යුදෙව් සංස්කෘතියෙහි වියුක්ත බවෙන් මිදීමට බහුතරයට වූ අවශ්‍යතාව බලපාන්නට ඇත. කතෝලික සංස්කෘතිය හා මුස්ලිම් සංස්කෘතිය අතර වූ ගැටුම් මැද ද ඒ සංස්කෘතීන් අතර යම් සම්බන්ධකම් තිබූ බව පෙනී යයි. විශේෂයෙන් ම වෙළෙඳාම ඔස්සේ පෙරදිග දැනුම අරාබි වෙළෙඳුන්ගෙන් කතෝලික යුරෝපයට ගලා ගියේ ය. මෙහි ප්‍රතිඵලය වූයේ එක් පැත්තකින් අරාබි මුස්ලිම් සංස්කෘතිය පෙරදිග දැනුම අවශෝෂණය කර වර්ධනය කිරීමත්, අනෙක් පැත්තෙන් කතෝලික සංස්කෘතිය ඒ දැනුම තම සංස්කෘතියට අවශෝෂණය කිරීමට උත්සාහ කිරීමත් ය.

එහෙත් ඒ සංස්කෘතීන් දෙක එහි දී ක්‍රියාකර ඇත්තේ දෙයාකාරයකට බව පැහැදිලි ය. භාරතීය සංස්කෘතියෙහි යම් වියුක්තභාවයක් තිබුණ ද එහි දැනුම බොහෝවිට නිර්මාණය වී තිබුණේ සංයුක්තව ය. අප ඇතැම් අවස්ථාවල කියා ඇති පරිදි එහි දී යෝග භාවනා ක්‍රම ද අභිඥාන ද උපයෝගී කරගන්නට ඇත. චීන සංස්කෘතියෙහි භාරතීය සංස්කෘතියෙහි තරමටවත් වියුක්තභාවයක් නො වී ය. ඉස්ලාම් සංස්කෘතිය ද පෙරදිග දැනුම් අවශෝෂණය කෙළේ සංයුක්තව ය. එහෙත් යුරෝපීය කතෝලික සංස්කෘතියට ඒ දැනුම් සංයුක්තව අවශෝෂණය කිරීමේ හැකියාවක් තිබී නැත. මෙය තරමක් ගැඹුරින් සාකච්ඡා කළ යුත්තකි. එයට හේතුව වන්නට ඇත්තේ යුරෝපීයයනට ඇරිස්ටෝටලීය න්‍යායෙන් කැඩීමට නොහැකිවීම යැයි සිතෙයි. කතෝලික සංස්කෘතියෙහි ත්‍රිකෝටික න්‍යාය තිබුණ ද එහි ඇරිස්ටෝටලීය න්‍යායෙහි බලපෑම දැඩිවිය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

' '

© Prof. Nalin De Silva